DOI: 10.31357/fhssmst.2015.00106

# නාගරික කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය

## (කැලණිය පොලිස් කොට්ඨාසය ඇසුරින්)

වසන්ත කිත්සිරි ජයලත්

අපරාධ විද්‍යාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති උපාධි පර්යේෂණයේ අවශ්‍යතා පසුරාලීම සඳහා 2014/10/07 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධයයි.

18 JUN 2015

# කර්තෘගේ ප්‍රකාශය

අපරධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ මහතාගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙහි අන්තර්ගත කිසිඳු කරුණක් වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරමි.

18/06/2015 .......... ..........

දිනය අත්සන

## උපදේශකවරයාගේ සහතිකය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පර්යේෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඩබ්.කේ.ජයලත් විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්‍ෂණය යටතේ සම්පාදනය වූවකි. මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති උපාධි පරීක්‍ෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටම පවතින බව තවදුරටත් මෙයින් සහතික කරමි. 2015 ජුනි මස 16 වැනි දින පැවැත් වූ වාචික පරික්ෂණයේ දී විභාග පරික්ෂකවරුන් විසින් පෙන්වා දෙනු ලැබූ අඩුපාඩු නිවැරදි කර  මෙම නිබන්ධ ඉදිරිපත් කළ බව  බව මෙයින් සහතික කරමි.

..................................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

උදය කුමාර අමරසිංහ

2015-06-18

..................................................

දිනය

# පටුන　　　　　　　　　　　　　　පිටු අංකය

පටුන I-X

සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර

රූප සටහන්

ස්තුතිය

සංක්ෂිප්තය

**පළමුවැනි පරිච්ඡේදය 1-15**

**පර්යේෂණ ක්‍රමවේදය**

1. මාතෘකාව

1.1 හැඳින්වීම

1.2 අධ්‍යයනයේ අරමුණු

1.3 පර්යේෂණ ගැටළුව

1.4 පර්යේෂණ ක්‍රමවේදය

1.4.1 මූලාශ්‍රයයෝ

1.4.2 අධ්‍යයන ප්‍රදේශය

1.4.3 නියැදිය

1.4.4 දත්ත රැස් කිරීමේ මෙවලම්

1.4.5 දත්ත විග්‍රහය

1.5 අධ්‍යයනයේ සීමා සහ දුෂ්කරතා

1.6 පරිච්ඡේදකරණය

**දෙවැනි පරිච්ඡේදය**

**2. සංකල්ප සහ න්‍යායයන් 16-48**

2.1 හැඳින්වීම

2.2 කාන්තාව පිළිබඳ නිර්වචන

2.2.1 නාගරික කාන්තාව

2.3 ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචන

2.3.1 ප්‍රචණ්ඩත්වය පිළිබඳ විද්‍යාත්මක රාමුව

2.3.2 ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක රාමුව

2.3.3 ලිංගික ප්‍රචණ්ඩත්වය

**2.4 ලිංගික අපරාධ සම්බන්ධ න්‍යායන්**

2.4.1 මනෝ ව්‍යාධිවේදී න්‍යායන්

2.4.2 සමාජ සංස්කෘතික න්‍යායයන්

2.4.3 ඉච්ඡාභංගත්ව හිංසකත්ව න්‍යාය

2.4.4 ලිංගික සංසර්ගය පිළිබඳ න්‍යාය

2.4.5 මනෝ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය

2.4.6 ස්වයං ආකල්ප න්‍යාය

2.4.7 පෙළඹවීමේ ලක්ෂණ සහිත න්‍යාය

2.4.8 සමාජ බැඳුම් න්‍යාය

2.4.9 සමාජ ඉගෙනුම් න්‍යාය

2.4.10 උප සංස්කෘතික න්‍යාය

2.4.11 ව්‍යුහාත්මක න්‍යාය

2.4.12 පිතෘමූලික න්‍යාය

## තෙවැනි පරිච්ඡේදය

**3. කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයන**

**49-62**

3.1 හැදින්වීම

3.2 නාගරික සහ ග්‍රාමීය කාන්තාවන්ට එරෙහි කාම අපරාධ

3.3 ගෘහස්ථ හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය

3.4 රැකියා ක්ෂේත්‍රවලදී කාන්තාවන්ට සිදුවන ලිංගික අතවර

3.5 සමූහ දූෂණ සහ ව්‍යාභිචාරය

3.6 විශ්වවිද්‍යාල තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය

3.7 සමීපතයින් විසින් සිදු කරනු ලබන ලිංගික හිංසන.

3.8 වතුකරය ආශ්‍රිත ලිංගික අපරාධ

3.9 සංක්‍රමණික කාන්තාවන් එරෙහි ලිංගික හිංසනය

3.10 පොදු ප්‍රවාහන සේවා ලිංගික අපරාධ

3.11 යුද්ධය,සුනාමිය සහ ලිංගික අපරාධ පිළිබඳ අධ්‍යයන.

3.12 ලිංගික අපරාධ සහ අපරාධ යුක්ති පද්ධතිය

3.13 කාන්තාවන්ට සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වීය අධ්‍යයන

## සිවුවැනි පරිච්ඡේදය 63-96

## 4. ශ්‍රී ලංකා අපරාධ නීතිය තුළ ලිංගික අපරාධ විග්‍රහ කර ඇති ආකාරය

4.1 හැදින්වීම

4.2 ස්ත්‍රී දූෂණය

4.2.1 සමුහ දූෂණ

4.2.2 වෛවාහික ස්ත්‍රී දූෂණය

4.2.3 ව්‍යාභිචාරය

4.2.4 ව්‍යවස්ථාපිත දූෂණය

4.2.5 භාරකාරත්වයේදී සිදු වන ස්ත්‍රී දූෂණ

4.3 බරපතල ලිංගික අපයෝජනය

4.4 ලිංගික අතවර

4.5 කුට්ටනය

4.6 අස්වාභාවික වැරදි

4.7 අශ්ශීල ප්‍රකාශන

4.8නාගරික කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය සහ පොලිස් විමර්ශනය

4.8.1 පොලිස් ස්ථානයකට පැමිණිල්ලක් වාර්තා කිරීම

4.8.2 කාන්තා සහ ළමා කාර්යාංශය

4.8.3 අපරාධ සිද්ධිය වු ස්ථානය විමර්ශනය කිරීම

4.8.4 වෛද්‍ය පරීක්ෂණය

4.9 චූදිතයින් සම්බන්ධයෙන් අදාළ වන කාර්ය පටිපාටිය.

4.9.1 රඳවා තබා ගැනීමේ කාලසීමාව.

4.9.2 සැකකරුට ඇප ලබාදීම.

4.9.3 අත් අඩංගුවේ නොමැති තැනැත්තෙකු අධිකරණය ඉදිරියට ගෙන ඒම.

**පස්වැනි පරිච්ඡේදය** **97-126**

**කැලණිය පොලිස් කොට්ඨාසය තුළ නාගරික කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ**

5.1 හැදින්වීම

5.2 කැලණිය පොලිස් කොට්ඨාසය

5.3 ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

5.3.1 දත්තදායිකාවන්ගේ වයස

5.3.2 දත්තදායිකාවන්ගේ අධ්‍යාපන මට්ටම

5.3.3 දත්තදායිකාවන්ගේ ආගම

5.3.4 දත්තදායිකාවන්ගේ විවාහක අවිවාහකභාවය

5.3.5 දත්තදායිකාවන්ගේ රැකියාවල ස්වභාවය.

5.4 ලිංගික අපරාධයෙහි සැකකරුගේ ස්වභාවය

5.5 සැකකරු ජීවත් වූ ප්‍රදේශය.

5.6 සැකකරු අපරාධය සිදු කළ වේලාව.

5.7 ලිංගික අපරාධවල ස්වභාවය.

5.7.1 ලිංගික අතවර.

5.7.2 ජංගම දුරකථන අන්තර්ජාලය හා ලිංගික හිංසනය

5.7.3 පොදු ස්ථානවලදී සිදු වූ ලිංගික අපරාධ

5.7.4 තානායම් තුළ සිදු වූ ලිංගික ප්‍රචණ්ඩත්වය

5.7.5 රැකියා ස්ථානවලදි සිදු වූ ලිංගික හිංසනයන්

5.7.6 ඇඟලුම් සේවිකාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය.

5.8 කාන්තා හා ළමා කාර්යාංශයේ ක්‍රියාකාරිත්වය

5.8.1 නිලධාරීන් මුහුණ දෙන ගැටළු

5.9 වින්දිත හැසිරිම් රටා

**හයවැනි පරිච්ඡේදය** 127-131

**නිගමන සහ යෝජනා**

6.1 හැදින්වීම

6.2 නිගමන

6.3 යෝජනා

6.3.1 කාන්තාවන් සඳහා වන නීතිමය වශයෙන් සවිබලකරණය

6.3.2 සමාජීය සවිබලකරණය

6.3.3 ඩිජිටල් තාක්ෂණය සහ ලිංගික අපරාධ

6.3.4 ආරක්ෂාව සහ රැකවරණය සැලසීම

6.3.7 උපදේශනය

7. අශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 132- 145

8. ඇමුණුම්

## සංඛ්‍යා වගු අංක


| වගු අංක | | පිටු අංකය |
| --- | --- | --- |
| වගු අංක 1.1 | ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ 2008-2012 | 03 |
| වගු අංක 1.2 | ස්ත්‍රී දූෂණ (2000- 2011) | 04 |
| වගු අංක 1.3 | කැලණිය පොලිස් කොට්ඨාසය කාන්තාවන්ට එරෙහිව සිදු වූ බරපතල අපරාධ | 06 |
| වගු අංක 1.4 | කැලණිය පොලිස් කොට්ඨාසය කාන්තාවන්ට එරෙහිව සිදු වූ සුළු අපරාධ | 07 |
| වගු අංක 4.1 | වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි කාන්තාවන්ට එරෙහි ලිංගික අපරාධ. | 90-91 |

# ප්‍රස්ථාර


| ප්‍රස්තාර අංක | පිටු අංක |
|---|---|
| ප්‍රස්තාර අංක 5.1 දත්තදායිකාවන්ගේ අධ්‍යාපන මට්ටම | 101 |
| ප්‍රස්තාර අංක 5.2 : ලිංගික අපරාධ සිදු වූ ස්ථාන | 115 |

## රූප සටහන්

| රූප සටහන් | | පිටු අංක |
|---|---|---|
| රූප සටහන් අංක 1.1 | මූලාශ්‍රයයෝ | 09 |
| රූප සටහන් අංක 2.1 | කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්ව න්‍යායයන් | 29 |
| රූප සටහන් අංක 2.2 | ආක්‍රමණශීලීත්වයේ ස්වභාවය | 33 |
| රූප සටහන් අංක 2.3 | සමාජ බැඳුම් න්‍යාය | 39 |
| රූප සටහන් අංක 2.4 | සමාජ බැඳුම් න්‍යාය | 42 |
| රූප සටහන් අංක 4.1 | කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික අපරාධ | 63 |

# ප්‍රණාමය

මෙම නිබන්ධය සාර්ථකව නිමකර ගැනීම සඳහා නිරතුරුව මා හට උපදෙස් ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයනාංශයේ අංශප්‍රධාන මහාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර මහතාට සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ මහතාට,

පර්යේෂණය සඳහා වන සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය යසාංජලී දේවිකා ජයතිලක මහත්මියට සහ මහාචාර්ය මයුර සමරකෝන් මහතාට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතාට, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සියළුදෙනාට,

අපරාධ සංඛ්‍යා ලේඛන හා අධ්‍යයනයට අදාළ සිතියම් ලබා දෙමින් මෙම පර්යේෂණ සාර්ථකව සිදු කිරීමට සහාය දැක් වූ කැලණිය පොලිස් කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විදිසිංහ මහතාට,

මා හට ක්ෂේත්‍ර සහාය ලබා දුන් උප පොලිස් පරීක්ෂක විජේරත්න මහතා, පොලිස් සැරයන් ලියනගේ මහතා, පොලිස් කොස්තාපල් ඉසංක මහතාට, කැලණිය පොලිස් කොට්ඨාසයේ සියළුම පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යාංශයන්හි ස්ථානාධිපතිවරියන්ට,

ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී දත්ත රැස් කිරීම සහ පරිගනකගත කිරීමේ දී සඳහා මා හට සහය දැක් වූ, ගයේන්ද්‍රා මෙනවිය සහ දිස්නි මෙනවිය, දුලානි මේනකා මෙනවියට දත්ත විශ්ලේෂණයේදී සහාය දැක් වූ සයනි මැණික්පුර මෙනවියට, පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍රය වූ සියලුම දත්තදායිකාවන්ට ස්තුතිය පළ කරමි.

## සංක්ෂිප්තය

කාන්තාවන්ට එරෙහිව හිංසනය ලොව පුරා කාන්තාවන්ට සිදුවන බරපතල තර්ජනයක් ලෙස එක්සත් ජාතින්ගේ සංවිධානය මෙන්ම ජාත්‍යන්තර සංවිධාන බොහොමයක් හඳුනා ගෙන ඇත. අපරාධ විද්‍යානුකූලව ද කාන්තා හිංසනය බරපතල මෙන්ම සුළු වරදක් ලෙස ද අර්ථ විග්‍රහ කරනු ලබයි. සහශ්‍ර සංවර්ධන ඉලක්ක සහ කාන්තාවන්ගේ අයිතීන් පිළිබඳව නිරන්තර සාකච්ඡා කරන සංවිධාන මෙය ප්‍රබල සමාජ ගැටළුවක් බව අනාවරණය කර ඇති අතර ඉන් කාන්තාවට සිදුවන හානිය මෙන්ම පවුල් සංස්ථාවට සිදුවන හානිය මෙතෙකැයි විවිධ අධ්‍යයනයන් තුළින් ගෙන හැර පෑමට උත්සාහ ගෙන තිබේ.

මෙම අධ්‍යයනය කාන්තාවන්ට සිදුවන හිංසනයෙහි එක් පැතිකඩක් වන ලිංගික හිංසනය කෙරෙහි අවධානය යොමු කරමින් නාගරික කාන්තා ප්‍රජාවට සිදු කරන බලපෑම පිළිබඳ පර්යේෂණ අත්දැකීම් ගොනු කර ඇත. මෙම අධ්‍යයනය සඳහා කැලණිය පොලිස් කොට්ඨාසය තුළ නාගරික කාන්තාවෝ සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළහ. ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක අධ්‍යයනයක් වන මෙම පර්යේෂණය තුළ නිරීක්ෂණය සහ සිද්ධි අධ්‍යයනයන් තුළින් ද දත්ත රැස් කෙරිණි. පරමාර්ථගත නියැදීම මගින් රැස් කළ දත්ත නව දත්ත රැස් කිරීමේ ක්‍රමවේද පාදක කර ගනිමින් විශ්ලේෂණය කෙරිණි.

නාගරික කාන්තාවන් විෂයයෙහි කේන්ද්‍රගත වූ මෙම අධ්‍යයනයේ දී ආරාධිතයින්ට වඩා සමීපතයින් විසින් කරනු ලබන වැරදි (74%) අනාවරණය වූ අතර කාලය සහ අවකාශය යන විචල්‍ය මෙම අපරාධ සිදු කිරීමට ප්‍රබල බලපෑමක් කර ඇති බව ද හෙළි වුණි. බහුතරයක් කාන්තාවෝ ලිංගික අතවර වලට බඳුන් වූ අතර අපරාධ යුක්ති පද්ධතිය ආශ්‍රිත ගැටළු ද පවතින බව මෙම අධ්‍යයනය විශද කරයි. එනිසා මෙම පර්යේෂණයෙහි නිගමන සහ යෝජනා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්මේන්තුවට මෙන්ම ඊට සම්බන්ධිත අනෙකුත් ආයතනයන්ට වඩාත් ඵලදායි වන්නේ කාන්තාවන්ට එරෙහි අපරාධ පාලනය සහ වැළැක්වීම උදෙසායි.

## පළමු වැනි පරිච්ඡේදය

### පර්යේෂණ ක්‍රමවේදය

1.1 හැඳින්වීම

1.2 අධ්‍යයනයේ අරමුණු

1.3 පර්යේෂණ ගැටළුව

1.4 පර්යේෂණ ක්‍රමවේදය

1.5 අධ්‍යයනයේ සීමාවන්

1.6 පරිච්ඡේදකරණය

# පළමුවැනි පරිච්ඡේදය

## නාගරික කාන්තාවන්ට සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය

## (කැලණිය පොලිස් කොට්ඨාසය ඇසුරින්)

### 1.1 හැඳින්වීම (Introduction)

කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ පමණක් නොව අනෙකුත් රටවල ද පොදු සමාජ ගැටළුවකි. මෙය සමාජයේ දක්නට ලැබෙන නව තත්ත්වයක් නොව අතීතයේ සිට පැවත එන්නකි. නමුත් වර්තමානයේ විවිධ සමාජ සංදර්භයන් තුළ කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනය විවිධාකාරයෙන් හඳුනා ගත හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යටතේ සාකච්ඡාවට බඳුන් වන එක් මාතෘකාවක් ලෙස කාන්තාවන්ට සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වය (Sexual Violence against Women) හැඳින්විය හැකිය. මෙවැනි ප්‍රචණ්ඩත්වයන් තුළින් මානසික ව්‍යාකූලතාවයන්, වෙනත් ශාරීරික හානි කර තත්ත්වයන්, වෙනත් රෝගී තත්ත්වයන් ද ජනිත වීමට පවතින සම්භාවිතාව ඉහළ අගයක් ගනී.

ගණිකා වෘත්තිය, ස්ත්‍රී දූෂණය, අස්වාභාවික වැරදි, ලිංගික අපයෝජනය, අසභ්‍ය ප්‍රකාශන පළ කිරීම ආදිය ඒ අතර වේ. ඉහත සඳහන් කළ ලිංගික ප්‍රචණ්ඩත්වය විවිධ සංස්කෘතීන් තුළ නිර්වචනය කර ඇත්තේ ඒ ඒ සංස්කෘතික ධර්මතා අගනාකම් මතය. නිදසුනක් ලෙස යම් රටක බහු ස්ත්‍රී සේවනය වරදක් (Offence) වන අතර තවත් රටක එය නීත්‍යානුකූල වේ. ලිංගික වෘත්තිය ඕස්ට්‍රේලියාව, ජර්මනිය, ග්‍රීසිය වැනි රටවල නීති ගත කළ ද උගන්ඩාව, පිලිපීනය, රුමේනියාව වැනි රටවල වරදක් ලෙස පිළිගැනේ. මේ ආකාරයට ලිංගික වැරදි හෙවත් ලිංගික ප්‍රචණ්ඩත්වය සංස්කෘතික අගනාකම් මත විවිධාකාරයෙන් අර්ථකථනය කරයි (Joddy,1997:29). ලිංගික වෘත්තියේ යෙදවීම ලිංගික අපරාධයක් සේම අසභ්‍ය ප්‍රකාශන පළ කිරීම ද ලෝකයේ බොහෝ රටවල සිදුවන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවකි.